මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/02** **2024.09.26**

# පාර්ලිමේන්තු මැතිවරණය - 2024

## නියමිත ඡන්ද පොළක දී ඡන්දිය දීමට නොහැකි වීම පිළිබඳ සාධාරණ බියක් ඇතිවිට ඡන්දය දීමේ කාර්ය පටිපාටිය

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ වගන්තිය මගින් නියමිත ඡන්ද පොළේ දී ස්වකීය ඡන්දය දීමට නොහැකිවීම පිළිබඳ සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට, වෙනත් යම් ඡන්ද පොළක දී ඡන්දය දීමට අවසර ඉල්ලා සිටිය හැකි බවත්, ඒ අනුව අදාළ අයට ඡන්දය දීම සඳහා වැඩ පිළිවෙලක් සැකසිය හැකි බවත්, මෙයින් දන්වනු ලැබේ.

පනතේ 127ආ.(1) උප වගන්තිය මෙසේය,

> **"වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොටගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, තමාගේ ඡන්දය, කොමසාරිස්වරයා* විසින් ඔහුගේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි ය."**
>
> (*මැතිවරණ කොමිෂන් සභාව)

එම ඡන්ද හිමියන්ට ස්වකීය ඉල්ලුම් පත්‍ර නාමයෝජනා දැන්වීමේ දින සිට දින 07ක් එනම් 2024.10.01 දිනට පෙර රාජගිරිය, සරණ මාවතේ පිහිටි, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට හෝ තමා පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට හෝ ඉදිරිපත් කළ හැකිය. ඉල්ලුම්කරුවන් විසින් 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන අදාළ විස්තර ඉල්ලුම් පත්වලට ඇතුළත් කළ යුතුය. මෙම නාමලේඛනයට අදාළ තොරතුරු සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/ කච්චේරිවල සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබනු ඇත. තවද, 2024 ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛන ලියාපදිංචි විස්තර www.elections.gov.lk වෙබ් අඩවියෙන්ද පරීක්ෂා කළ හැකිය.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිවැරදි බවට සනාථ කළ යුතු වේ. ඉල්ලුම් පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් නොමිලේ ලබාගත හැකි අතර www.elections.gov.lk වෙබ් අඩවියෙන්ද බාගත කළ හැකිය.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්